ශ්‍රී ලංකා වරාය අධිකාරිය

# කොවිඩ්-19 වසංගතය
# තුරන් කිරීමේ මාර්ගෝපදේශය



**සේවා ස්ථානවල කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වාලීමේ පෙර සුදානම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා වන මෙහෙයුම් මාර්ග උපදේශ මාලාව**

දෙවැනි සංස්කරණය

**කොවිඩ්-19 රෝගයට හේතුවන වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා සබන් යොදා අත් සේදීම වඩාත් සාර්ථක ම පිළිවෙතයි**

# කොවිඩ්-19

**SARS-Cov2 නමැති වෛරසයෙන් ඇති කරන රෝගයකි**

## නව කොරෝනා වෛරසය

නව කොරෝනා වෛරස් යනු සතුන් අතර පැතිරෙන වෛරස් විශේෂයකි. නමුත් ඇතැම් අවස්ථා වලදී එම වෛරස මිනිසුන්ගේ ශරීරයට ඇතුළු විය හැකිය. 2019 වසර අග භාගයේදී චීනයේදී හමුවූ නව කොරෝනා වෛරසය මීට පෙර මිනිස් ශරීර වල හමු නොවුණු අලුත් වෛරසයකි.

## රෝගය වැළැක්වීම

**බලපෑමට ලක් වූ ප්‍රදේශයට ගමන් කිරීමේදී**

- අසනීප පුද්ගලයින් සමග සම්බන්ධ වීමෙන් වළකින්න
- සබන් ගා වතුරෙන් අත් සෝදන්න
- මුඛ-නාස් ආවරණ පැළඳීම

**කුමන හෝ ප්‍රදේශයකට ගමන් කිරීමේදී මූලික සනීපාරක්ෂක පිළිවෙත් අනුගමනය කරන්න**



## රෝග ලක්ෂණ

- උණ
- කැස්ස
- හුස්මගැනීමේ අපහසුව
- මාංශපේශි වේදනාව
- අසාමාන්‍යය මහන්සිය

## රෝග සම්ප්‍රේෂණය

**කැස්ස, කිවිසුම් යෑමේදී හෝ කතා කිරීමේදී පිටවන බිඳිති වලින්**

දින **2 – 14**

රෝග ලක්ෂණ පහළ වීමට ගතවන කාලය



සේවා ස්ථානයේදී රෝගී බවට සැක සහිත (ශ්වසන රෝග ඇතිව හෝ නැතිව උණ ඇති) පුද්ගලයෙක් අනාවරණය වුවහොත් අදාල කොට්ඨාශයේ වගකිව යුතු ඉහළ නිළධාරියාට වහාම දැනුම් දිය යුතුය. එම බලයලත් නිළධාරියා වරාය අධිකාරියේ වෛද්‍ය මධ්‍යස්ථානයේ

**ක්ෂණික දුරකථන අංකය (Hotline) 2343**

අමතා ලැබෙන උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

# අරමුණ

ශ්‍රී ලංකාව තුළ පවතින කොවිඩ්-19 වසංගතය පැතිරයෑමේ අවදානම් තත්ත්වය හමුවේ එය බෝ කරන වෛරසය වරාය පරිශ්‍රය තුළ ව්‍යාප්ත වීම වැළක්වීමට අවශ්‍ය නිසි පියවර ගනිමින්, වරාය මෙහෙයුම් සාර්ථකව පවත්වාගෙන යෑමට විවිධාකාරයෙන් සම්බන්ධ වන සියළුම දෙනා වසංගතයෙන් ආරක්ෂා කරගැනීම සහ වරාය මෙහෙයුම් කාර්යක්ෂමව, ඵලදායීව සහ ගුණාත්මක බවින් යුතුව අඛණ්ඩව පවත්වා ගැනීම.

# පටුන


**හැඳින්වීම** 05

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිතුමාගේ පණිවිඩය** 06

**සේවා ස්ථාන වල රෝගය සම්ප්‍රේෂණය විය හැකි ක්‍රම** 07

**සේවා ස්ථානය ප්‍රතිව්‍යුහගත කිරීම** 07

**කොවිඩ්-19 වෛරසය ව්‍යාප්තිය හා ආසාදනය වැළැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධවයි** 08

**කොවිඩ්-19 වෛරසය ආසාදිත පුද්ගලයන් සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග** 09

**රෝගය වළක්වා ගැනීමට පොදුවේ ගත යුතු ක්‍රියාමාර්ග** 10

- සේවයට වාර්තා නොකළ යුතු සේවකයින්
- සේවකයින්ගේ ශරීර උෂ්ණත්ව පරීක්ෂාව
- කොට්ඨාශ වලට පැවරී ඇති පොදු වගකීම්
- සේවක මහත්ම මහත්මීන්ගේ වගකීම්
- ගමනාගමන පහසුකම්
- සැක සහිත ආසාදිතයෙකු හමු වූ විට ගත යුතු පියවර
- ආසාදිත පුද්ගලයෙකු හමු වූ විට ගත යුතු ක්‍රියාමාර්ග
- නේවාසිකාකාර බැරක්ක සහ විවේකාගාර
- සේවය නිමා කළ පසු කළ යුතු දේ
- සේවය නිමවා නිවසට ගිය පසු/යළි සේවයට පැමිණීමේ දී කළ යුතු දේ

**සේවයට වාර්තා කිරීමට පෙර නිරෝධායන ඇඳිරිනීතිය පනවා ඇති හෝ/සහ හුදකලා ප්‍රදේශ ලෙස නම්කර ඇති ප්‍රදේශවල සිට පැමිණෙන සේවකයන් විසින් සම්පූර්ණ කළ යුතු පත්‍රිකාව** 14

**සේවයට වාර්තා කිරීමට පෙර නිරෝධායන ඇඳිරි නීතිය පනවා නැති හෝ/සහ හුදකලා ප්‍රදේශ ලෙස නම්කර නැති ප්‍රදේශවල සිට පැමිණෙන සේවකයන් විසින් සම්පූර්ණ කළ යුතු පත්‍රිකාව** 15

**සේවයට වාර්තා කිරීමේ දී/ සේවයෙන් නික්ම යෑමේ දී සේවකයන් විසින් සම්පූර්ණ කළ යුතු පත්‍රිකාව** 16

**කොට්ඨාශ හා අනෙකුත් සේවා සඳහා වූ විශේෂ වත් පිළිවෙත්** 17

- ආරක්ෂක කොට්ඨාශය
- ක්‍රියාකරවන කොට්ඨාශය
- සේවා සැපයුම් කොට්ඨාශය
- තොරතුරු පද්ධති කොට්ඨාශය
- වෛද්‍ය කොට්ඨාශය
- නාවික කොට්ඨාශය
- සුභ සාධක හා කාර්මික සබඳතා කොට්ඨාශය
- ඉංජිනේරු කොට්ඨාශය

**පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව** 24

**වරාය භාවිතා කරන්නන්** 24

# හැඳින්වීම

කොවිඩ්-19 යනු මීට පෙර මෙතක් හමු නොවුණු කොරෝනා වෛරසයකින් ආසාදනය වන ස්වශන රෝගයකි. SARS-CoV2 නමින් විද්‍යාත්මකව හඳුන්වන මෙම රෝග කාරක වෛරසය (Disease causative agent) අසාධනය වීමෙන් පසු රෝග ලක්ෂණ පෙන්වීම සඳහා දින දෙකේ සිට දහහතර දක්වා කාලයක් ගත වන නමුත් ඇතැම් අවස්ථාවලදී රෝගය අසාදනය වූ අයෙකු කිසිඳු රෝග ලක්ෂණයක් නොපෙන්විය හැකි බව පර්යේෂණ වලින් ඔප්පු කොට ඇත. මෙම වෛරසයේ ඇති සංකීර්ණ ස්වභාවය නිසා කොවිඩ්-19 රෝගය ලොව පුරා සීඝ්‍රයෙන් පැතිරෙන අතර මෙය ගෝලීය අධි වසංගතයක් ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය ප්‍රකාශයට පත්කොට ඇත. මේ වන විට රටවල් සහ විශේෂ පරිපාලන කලාප 220කට වඩා වැඩි ප්‍රමාණයක පැතිරී ඇති මෙම රෝගයෙහි ඇති බරපතළකම කිසිම ලෙසකින් සුළුකොට තැකිය නොහැක. මෙම දෙවැනි සංස්කරණය ප්‍රකාශයට පත් කරන මොහොත වන විට ලක්ෂ 16 කට වැඩි පුද්ගලයින් ප්‍රමාණයක් මෙම වෛරසය ආසාදනය වී මියගෙ ාස් ඇති අතර, ලක්ෂ 700කට අධික ප්‍රමාණයකට මෙම වෛරසය ආසාදනය වී ඇත. දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝකය මුහුණ දෙන විශාලතම අභියෝගය මෙම වසංගතය බව එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රකාශ කොට ඇත. එසේම, නාවික කටයුතු කර්මාන්තය පැත්තෙන් ගෙන බැලූ විට, මෙම වසංගතය ගෝලීය සැපයුම් ජාලයට සිදුකොට ඇති බලපෑම ඉතා විශාලය.

**ජාතියේ හදවත වන වරායේ මෙහෙයුම් කිසිඳු අවහිරයකින් තොරව පවත්වාගෙන යෑමට උරදීම සහ වරායෙහි සේවය කරන මෙන්ම එහි සේවාව ලබන සියලුම පාර්ශවයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම අපි සියලුදෙනා හමුවේ පැවරෙන මූලික වගකීම වේ. එය කිසිවෙකුට තනියම කළ නොහැකි අතර සෑම අයෙකුම දම්වැලක පුරුක් මෙන් සහයෝගයෙන් බැඳී සිටිමින් ඉටු කළ යුතු සාමූහික ප්‍රයත්නයකි.**

මුලදී ඉතා සුළු වශයෙන් රෝගීන් හඳුනාගනු ලැබුවද මේ වන විට ශ්‍රී ලංකාව තුළද රෝගීන් වැඩි වීමේ ප්‍රවණතාවයක් වාර්තා වී ඇත. මේ වන විටත් තත්වය හොඳින් පාලනය කරගෙන ඇති අතර රාජ්‍යය බලධාරීන් විසින් මෙම රෝග ව්‍යසනයෙන් රට මුදාගෙන ජනජීවිතය සුරක්ෂිත කිරීමේ උපාය මාර්ගික සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කරමින් සිටිති. මෙම වෛරසයේ ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා රජය විසින් මූලික සැලසුම් සකස් කරන මුල් අවස්ථාවේදීම රටේ ආර්ථික කටයුතු සඳහා මූලික අවශ්‍යතාවයක් වන ගෝලීය සැපයුම් ක්‍රියාදාමය අඛණ්ඩව පවත්වා ගෙන යෑමේ දී ප්‍රබල කාර්යභාර්යයක් ඉටු කරන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඊට ක්‍රියාකාරීව සහභාගී විය. එසේම ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය, කොළඹ වරායේ මෙහෙයුම් කටයුතුවලට දායකවන අනෙකුත් සහෝදර පර්යන්ත සමාගම් වන සවුත් ඒසියා ගේට්වේ ටර්මිනල් (SAGT), කළම්බෝ ඉන්ටනැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) සහ වරාය මෙහෙයුම් වලට අදාළ විවිධ කටයුතු වලට සම්බන්ධ පාර්ශව කරුවන්ගේ අදහස් හා යෝජනා සැලකිල්ට ගනිමින් රට තුළ පවතින කොවිඩ්-19 රෝගය පැතිරයෑමේ අවදානම් තත්වය හමුවේ එම වෛරසය වරාය පරිශ්‍රය තුළ පැතිරයාම වැළැක්වීමට අවශ්‍ය නිසි පියවර ගනිමින් වරාය මෙහෙයුම් කාර්යක්ෂමව, ඵලදායීව හා ගුණාත්මක බවින් අඛණ්ඩව පවත්වා ගෙනයාම සඳහා සියළු පියවර ගන්නා ලදි. ඒ සඳහා සියළු ම නිළධාරීන් හා සේවක සේවිකාවන්ගේ කැපවීම අතිමහත් ය.

එහි තවත් එක් පියවරක් ලෙස, රජය හා සෞඛ්‍ය බලධාරීන් විසින් ප්‍රකාශයට පත්කරන ලද උපදෙස් මාලාවට අනුව වරාය පරිශ්‍රය තුළ අනුගමන කළයුතු පොදු ක්‍රියා පිළිවෙතක අවශ්‍යතාවය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් හඳුනාගෙන ඇත. වසංගතය පාලනය කිරීමෙන් පසු උදාවන නව සාමන්‍යය තත්වය (New Normal Situation) වඩාත් නිවැරදිව කළමනාකරණය ගත හැකිවන්නේ එවිටය. ජාතියේ හදවත වන වරායේ මෙහෙයුම් කිසිඳු අවහිරයකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යෑමට උරදීම සහ වරායෙහි සේවය කරන මෙන්ම එහි සේවාව ලබන සියළුම පාර්ශවයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම අපි සියලුදෙනා හමුවේ පැවරෙන මූලික වගකීම වේ. එය කිසිවෙකුට තනියම කළ නොහැකි අතර සෑම අයෙකුම දම්වැලක පුරුක් මෙන් සහයෝගයෙන් බැඳී සිටිමින් ඉටු කළ යුතු සාමූහික ප්‍රයත්නයකි. ඒ සඳහා නිවැරදි සෞඛ්‍ය වත්පිළිවෙත් පිළිපදිමින් අපේ ආරක්ෂාවත්, අප සමීපයේ සිටින සහ අපිව ඇසුරුකරන අනෙකාගේ ආරක්ෂාවත්, සමස්ථ රටේ ආරක්ෂාවත් තහවුරු කිරීමට නොමසුරුව එකතු වීම සෑම දෙනෙකුම ඉටුකළ යුතු යුතුකමකි.

ඒ අනුව වාරාය පරිශ්‍රය භාවිතා කරන සියළුම පාර්ශවයන් විසින් අනිවාර්යයෙන් අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත මෙම මාර්ගෝපදේශය මගින් පැහැදිළි කරනු ලැබේ. මෙය අපි සියලු දෙනාගේම ආරක්ෂාව වෙනුවෙන් නිර්මාණය කරනු ලැබූ අතර මෙහි කරුණු ක්‍රමවත්ව සහ සහයෝගයෙන් පිළිපැදීම අප විසින් අපට සහ වරායට මෙන්ම රටට කරන සුවිශාල සේවයකි.

# ගරු සභාපතිතුමාගේ පණිවිඩය

සියලු සේවක මහත්ම මහත්මීන් වෙත...

අප මාතෘභූමිය අභියෝගාත්මක කාල පරිච්ඡේදයක් පසු කරමින් සිටින කාලවකවානුවක දේශයේ හදවත වන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභිමානවත් සාමාජිකයින් වන ඔබ ආමන්ත්‍රණය කිරීම මේ මොහොතේ මා වෙතින් ඉටුවිය යුතු වගකීමකැයි මා විශ්වාස කරමි. ජාතියේ හදවත කිසිදු අවහිරතාවයක් නොමැතිව සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීම සඳහා අවංකව සහයෝගය ලබා දීම අප සියලු දෙනාගේ ම ප්‍රමුඛ වගකීම වේ.

**ඔබ ශ්‍රී ලංකා වරාය අධිකාරියට ඇති අගනාම සම්පතකි. එබැවින් ඔබ ආරක්ෂා කර ගැනීම ආයතනයක් ලෙස අපගේ පළමු වගකීමයි. ඒ සඳහා ඇවැසි සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත**

ලෝකයේ සෑම රටක්ම පාහේ කොවිඩ්-19 අධි වසංගත තත්ත්වය හමුවේ බරපතල ලෙස අකර්මන්‍යව ඇති බව අපි දනිමු. කොවිඩ්-19 පළමු රැල්ල ලොව ම දුර්මුඛ කළ වකවානුවක අපි එය නිවැරදිව කළමණාකරණය කොට පරාජය කරන්නට ජාතියක් වශයෙන් සමත් වුණෙමු.

එම අභියෝගයම නැවතත් පෙරට වඩා ප්‍රචණ්ඩව අප හමුවේ ඇත. එබැවින් ඔබ අප සැම එක් වී ඊට එරෙහිව නැගී සිටිය යුතු මොහොත දැන් එළඹ ඇත. සෞඛ්‍යාරක්ෂණ ක්‍රමවේද නිසි ලෙසින් අනුගමනය කරමින් උපාය මාර්ගික ක්‍රමවේදයන් ඔස්සේ ක්‍රියාත්මක වීමෙන් පවතින දුෂ්කර තත්ත්වය සාමූහිකව ජය ගැනීමට අපට හැකිවනු ඇත.

අප මාතෘභූමියේ වෙසෙන සමස්ත සහෝදර ශ්‍රී ලාංකික ජනතාවට අවැසි ආහාර, ඖෂධ, ඇතුළු ජන ජීවිතයට අත්‍යවශ්‍ය වන්නා වූ සියල්ල රට තුළට රැගෙන එන සහ විදේශ විනිමය මෙරටට කැන්දන දේශීය නිෂ්පාදනයන් ජාත්‍යන්තරයට රැගෙන යන මෙහෙවරේ ප්‍රමුඛයා ශ්‍රී ලංකා වරාය අධිකාරිය බැව් අපි දනිමු. එහි ජීවනාලිය රඳා පවතිනුයේ ඔබ දෑත්මතය. එබැවින් මව්බිම උදෙසා අප විසින් ඉටුකළ යුතු සුවිසල් වගකීමක් සියලු දෙනා වෙත පැවරී ඇත. ආයතනයක් ලෙසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මේ දේශයේ විශිෂ්ඨතම ආයතනයක් බවට පත්වූයේ, රටට මෙන්ම සිය ආයතනයට ද එකසේ ආදරය සහ ගෞරවය දක්වන විශිෂ්ඨ මානව සම්පතකින් අප පරිපූර්ණ වූ බැවිණි. ලොව බහලු මෙහෙයුම් වරායයන් අතර අති විශිෂ්ඨත්වයට පත්වීම ම එයට එක් උදාහරණයක් පමණි.

එබැවින් මේ මොහොතේ අප රට පත්ව ඇති දුෂ්කරතාවයෙන් මුදවා රට තිරසාර සංවර්ධන ඉලක්ක කරා රැගෙන යාමේ කාර්ය භාරය තුළ අප ආයතනය වෙත ඉමහත් වූ වගකීමක් පැවරී ඇත. රටක් වශයෙන් අප මාතෘභූමිය ද ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ද දුෂ්කරතාවයන්ට, අභියෝගයන්ට මුහුණ පෑ සෑම විටෙකම පුරවැසියන් ලෙසින් මෙන්ම ආයතනයේ සාමාජිකයන් ලෙසින් ද පෙරට ආ සටන්කාමී සහ සැබෑ දේශප්‍රේමී ඉතිහාසයක් ඔබ සැමට ඇත.

ඔබ ශ්‍රී ලංකා වරාය අධිකාරියට ඇති අගනාම සම්පත බව මා නැවත කියමි. එබැවින් ඔබ ආරක්ෂා කර ගැනීම ආයතනයක් ලෙස අපගේ පළමු වගකීමයි. ඒ සඳහා ඇවැසි සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත. ඔබගේ රැකවරණය වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියට ද පසුබට නොවන්නෙමි. නියමිත සෞඛ්‍ය ආරක්ෂණ උපක්‍රම පිළිපැදීමෙන් කොවිඩ්-19 වසංගතයෙන් ආරක්ෂා විය හැකි බව අප සැම දනිමු.

මේ රටට ඔබ අවැසිම මොහොතයි. මව්බිම පත්ව ඇති දුෂ්කර අභියෝගයෙන් මුදවා ගැනීමට පෙරමුණ ගන්නා ඔබ උපනුපන් පරම්පරාවල ගෞරවයට පාත්‍ර වනු ඇත. එබැවින් නිසි පරිදි රාජකාරී කටයුතු සඳහා ඔබේ දායකත්වය ලබා දී මෙම ජාතික කර්තව්‍ය වෙනුවෙන් සිය වගකීමට උරදී කටයුතු කරනු ඇතැයි මම උදෙක්ම අපේක්ෂා කරමි. ඔබ, ඔබ හා ඔබගේ පවුල වෙනුවෙන් මෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ අපගේ මව්බිම වෙනුවෙන් යුතුකම් ඉටු කරන්නට කැපවෙන මෙන් ඔබගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

**ජෙනරාල් ආර්.එම්.ඩී. රත්නායක**
**සභාපති**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**

## 1. සේවා ස්ථාන වල රෝගය සම්ප්‍රේෂණය විය හැකි ක්‍රම

රෝගය සම්ප්‍රේෂණය වීම පහත සඳහන් ක්‍රම තුන මගින් සිදුවිය හැකි බව වෛද්‍යය පර්යේෂණ තහවුරු කොට තිබේ.

**රෝගය අසාදනය විය හැකි ප්‍රධාන ක්‍රම තුනකි**

- **කෙළ බිඳිති**

  අසාදිත කෙළ බිඳිති ආශ්‍රහණය මගින් වෛරසය සම්ප්‍රේෂණය විය හැකි ය. අසාදිත පුද්ගලයකු කහින විට, කිවිසුම් යැවීමේදී හෝ ප්‍රශ්වාසයෙදී කෙළ බිඳිති ජනනය විය හැක. මෙවැනි කෙළ බිඳිති මීටරයකට වඩා වැඩි දුරකට පැතිර යා හැකි ය.

- **සෘජු සම්බන්ධතා**

  රෝගී පුද්ගලයකු සමග සෘජු සබඳතාවයක් පැවැත්වීම මගින් (සිප වැළඳ ගැනීම හා අතට අත දීම වැනි) එම අසාදිත පුද්ගලයාගෙන් වෙනත් නිරෝගී පුද්ගලයකුට රෝගය බෝවිය හැඳි ය. වෛරසය නාසය, ඇස් හෝ මුඛ මාර්ගයෙන් ශරීරයට ඇතුල් විය හැක.

- **සෘජු නොවන සම්බන්ධතා**


  අසාදිත පුද්ගලයකු කහින විට, කිවිසුම් යැවීමේදී හෝ ප්‍රශ්වාස කරන විට, නිපදවන අසාදිත කෙළ බිඳිති අවට ඇති ද්‍රව්‍ය සහ පෘෂ්ඨ මත පතිත වන අතර නිරෝගී පුද්ගලයෙකු එම පෘෂ්ඨයක් ඇල්ලීමෙන් පසු, තම ඇස්, නාසය හෝ මුඛය ඇල්ලීමෙන් වෛරසය ශරීර ගතවිය හැකිය.

## 2. සේවා ස්ථානය ප්‍රතිව්‍යුහගත කිරීම

සේවා ස්ථානයේ සේවකයන් අතර අවශ්‍ය භෞතික දුර පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය ක්‍රියාවලියන්ට පමණක් සේවා මෙහෙයුම් සීමා කිරීම, නම්‍යශීලීව වැඩ කරන වේලාවන් සහ කාර්යාලීය සැකැස්ම වෙනස් කිරීම වැනි ප්‍රතිපත්ති සහ භාවිතයන් සමාලෝචනය කළ යුතු ය. මෙය කොට්ඨාශ ප්‍රධානීයාගේ අභිමතයට සහ අනුමැතියට යටත්විය යුතු ය.

- එකිනෙකාගෙන් දුරස්ථව සිටීමට ඉඩ සැලසීම සඳහා එක් වේලාවක සේවා ස්ථානයක සිටින මුළු සේවක සංඛ්‍යාව අඩු කිරීම සඳහා විකල්ප දින හෝ අමතර සේවා මුර ඇති කළ යුතු ය.
- සේවකයින් අතර මීටරයක දුරක් තබා ගැනීමට හැකි වන පරිදි සේවා ස්ථානය සකස් කළ යුතු ය.
- මෙහෙයුම් ක්‍රියාවලියේ දී හැකිතාක් දුරට විද්‍යුත් පණිවිඩ හුවමාරු ක්‍රම භාවිතා කරමින් සේවකයින් අතර සිදු විය හැකි භෞතික සම්බන්ධතා අවම කළ යුතු ය.





# 3. චක්‍රලේඛය:

## කොවිඩ්-19 වෛරසය ව්‍යාප්තිය හා ආසාදනය වැළැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධවයි

රට තුළ ව්‍යාප්ත වන කොවිඩ්-19 වසංගතය හමුවේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සපයනු ලබන සේවාව අඩපන වීමට නොදී අඛණ්ඩව පවත්වාගෙන යා යුතුව ඇත.

ඒ සඳහා මේ වන විටත් වරාය තුළ කොවිඩ්-19 වෛරසය ව්‍යාප්ත වීම හා ආසාදනය වීම වලක්වා ගැනීමට අවශ්‍ය සියලුම සෞඛ්‍යාරක්ෂිත විධි විධාන යොදා ඇත.

ඒ අතුරින් ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 වෛරසය ආසාදනය වීමට ඉඩ ඇතැයි සැලකෙන සැක සහිත පුද්ගලයන් අහඹු ලෙස PCR පරීක්ෂණයක ට යොමු කිරීම ට කටයුතු කරමින් පවතී. එලෙස PCR පරීක්ෂණ වලට යොමු වන සේවකයින්, එම පරීක්ෂණ ප්‍රතිඵල අනුව කොවිඩ්-19 වෛරසය ආසාදනය වී ඇති බවට තහවුරු වී ඇති සේවකයින් හා කොවිඩ්-19 වෛරසය ආසාදනය වූ පුද්ගලයෙකු සමග සෘජු ව සම්බන්ධ වූ සේවකයින් පහත පරිදි කටයුතු කළ යුතු ය.

**වරාය අධිකාරියේ චක්‍රලේඛ අංකඃ**

**20/2020**

01. PCR පරීක්ෂණයට යොමු වූ සේවකයින් එම පරීක්ෂණයේ ප්‍රතිඵල ලැබෙන තෙක් සේවා ස්ථානයේ රැඳී සිටිය යුතු අතර ඉන් පසු අදාළ බළධාරීන්ගේ උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය.

02. PCR පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව කොවිඩ්-19 වෛරසය ආසාදනය වී ඇති බව ට තහවුරු වූ සේවකයින් සේවා ස්ථානයේ වෙනත් සේවකයින් හා සම්බන්ධ නොවී රැඳී සිටිමින් ප්‍රධාන වෛද්‍ය නිළධාරී/ කෙට්ඨාශ ප්‍රධානියාගේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු ය.

03. කොවිඩ්-19 වෛරසය ආසාදිත සේවකයින් ඔහු/ ඇය ගමන්කළ ස්ථාන, සම්බන්ධතා පැවැත්වූ පුද්ගලයින් පිළිබඳ නිවැරදි තොරතුරු ලබා දිය යුතු ය.

04. කොවිඩ්-19 වෛරසය ආසාදිත සේවකයින් සමග සෘජු සම්බන්ධතා පැවැත්වූ සේවකයින් ඒ පිළිබඳව ප්‍රධාන වෛද්‍ය නිළධාරී/ කොට්ඨාශ ප්‍රධානී ට දැනුම් දී අදාළ බළධාරීන්ගේ උපදෙස් ලැබෙන තෙක් සේවා ස්ථානයේ අනෙකුත් සේවකයින්ගෙන් වෙන් වී සිටිය යුතු ය.

05. ඉහත අංක 01. 02. 03. සහ 04. හි සඳහන් සේවකයින් කිසිදු අවස්ථාවක ප්‍රධාන වෛද්‍ය නිළධාරී/ කොට්ඨාශ ප්‍රධානියාගේ අවසරය නොමැතිව රාජකාරියෙන් මිදී තම නිවෙස් හෝ වෙනත් ස්ථාන කරා පිටත්ව යෑම නොකළ යුතු ය.

ඉහත සඳහන් ක්‍රියාමාර්ග තරයේ ම අනුගමනය කරන ලෙස සියලු දෙනාට ම මෙයින් දැනුම් දෙන අතර, මෙම ක්‍රියාමාර්ග කඩකරන සියලු ම සේවක මහත්ම මහත්මීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරන බව මෙයින් දන්වා සිටිමි.

*ජෙනරාල් ආර්.එම්.ඩී. රත්නායක*
සභාපති

2020.11.04 දින දී ය.

# 4. චක්‍රලේඛය:

## කොවිඩ්-19 වෛරසය ආසාදිත පුද්ගලයන් සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග

වරාය අධිකාරියේ චක්‍රලේඛ අංක 20/2020 ට වැඩිමනත් වශයෙනි.

**වරාය අධිකාරියේ චක්‍රලේඛ අංකය:**

**24/2020**

වත්මන් තත්ත්වය අනුව වරාය අධිකාරියේ සේවක පිරිස් කොවිඩ්-19 වෛරසය ආසාදනය වෙමින් සිටින බව වාර්තා වේ. මෙම ආසාදිත සේවක පිරිස් මගින් මෙම වෛරසය අනෙකුත් සේවකයන්ට ආසාදනය වීම වලක්වා ගැනීමට හැකි සෑම පියවරක් ම ගත යුතුව ඇත.

එබැවින් ඒ සඳහා යථෝක්ත චක්‍රලේඛ උපදෙස් පරිදි සියළුම සේවකයින් ක්‍රියා කළ යුතු අතර, ඊට අමතරව PCR පරීක්ෂණ වලින් කොවිඩ්-19 වෛරසය ආසාදිත බව ට තහවුරු වන සේවකයින් සම්බන්ධයෙන් කොට්ඨාශ ප්‍රධානීන් පහත පරිදි කටයුතු කළ යුතු බව මෙයින් දන්වා සිටිමි.

01. ඔබ කොට්ඨාශයේ සේවකයින් කොවිඩ් 19 වෛරසය ආසාදිත බව ට තහවුරු වූ වහා ම ඔහු/ ඇය අනෙකුත් සේවකයන්ගෙන් වෙන් කර තැබිය යුතු ය. ඉන් පසු ප්‍රධාන වෛද්‍ය නිළධාරී සමග සම්බන්ධ වී එම සේවකයා වරාය අධිකාරියේ වෛද්‍ය මධ්‍යස්ථානය හරහා රෝහලක් වෙත යොමු කිරීමට පියවර ගත යුතු ය.

02. කොවිඩ්-19 වෛරසය ආසාදිත බව ට තහවුරු වූ සේවකයින්ගේ අවශ්‍ය සියලු තොරතුරු විමසා එම තොරතුරු ලේඛණගත කළ යුතු වේ. (පළමු ආශ්‍රිතයින් කවුද, ඔවුන් ගමන් ගත් ස්ථාන, ගමන් ගත් වාහන ආදී තොරතුරු)

03. අදාල කොට්ඨාශය විසින් ආසාදිත සේවකයන්ගේ පළමු ආශ්‍රිතයින් සොයා ඔවුන් සියළු දෙනාට ම ප්‍රවාහන පහසුකම් සපයා ඔවුන්ගෙ නිවෙස් වල ස්වයං නිරෝධායනය සඳහා යොමු කළ යුතු ය. අදාල කොට්ඨාශ ප්‍රධානීන් විසින් මෙම සේවකයන් නිවෙස් කරා පිටත් කර යවන තෙක් ඔවුන් වෙන් කර තැබීමට පියවර ගත යුතු ය. එම ස්වයං නිරෝධායනය කරන සේවකයන්ගේ ද විස්තර ඇතුලත් ලේඛනයක් තබා ගත යුතු වේ. (නම, තනතුර, පදිංචිය, දුරකතන අංක ආදී)

04. ස්වයං නිරෝධායනයට යොමු කළ සේවකයන්ට, නිරෝධායන කාලය තුළ යම් රෝග ලක්ෂණයක් පහළ වන්නේ නම් ඒ බව කොට්ඨාශ ප්‍රධානියා ට ද, ප්‍රදේශ භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකට හෝ ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරියා වෙත ද දැනුම් දී ඔවුන්ගේ උපදෙස් පරිදි ප්‍රතිකාර සඳහා යොමු විය යුතු බව ට කොට්ඨාශ ප්‍රධානියා විසින් සේවකයන් දැනුවත් කළ යුතු ය.

05. ස්වයං නිරෝධානයකයට යොමු කළ සේවකයින් නිරෝධායන කාලසීමාව අවසානයේ දී කිසිදු රෝග ලක්ෂණයක් නොමැති නම් ප්‍රධාන වෛද නිළධාරීගේ නිර්දේශය මත යළි සේවයෙහි පිහිටුවිය යුතු ය.

06. යම් සේවකයෙක් කොවිඩ්-19 වෛරසය ආසාධිත වී ඇති බව තහවුරු වූ විට ඉතාමත් වගකීමෙන් යුතු ව, ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කොට්ඨාශ ප්‍රධානියා විසින් පියවර ගත යුතු ය.

*ජෙනරාල් ආර්.එම්.ඩී. රත්නායක*
සභාපති

2020.11.19 දින දී ය.

# 5. රෝගය වළක්වා ගැනීමට පොදුවේ ගත යුතු ක්‍රියාමාර්ග

**5.1 පහත සඳහන් කාණ්ඩවල සේවකයින් කිසිවිටකත් සේවය සඳහා වාර්තා නොකළ යුතුය.**

- ශ්වසන රෝග ලක්ෂණ (කැස්ස, නාසයෙන් සොටු දියර ගැලීම, උගුර අසාදනය සහ හුස්ම ගැනීමේ අපහසුතාව ආදී) ඇති හෝ නැති නමුත් උණ සහිත පුද්ගලයින්,
- පසුගිය දින 14 තුළ නව කොරෝනා අසාදනය පිළිබඳ සැක සහිත හෝ තහවුරු කළ පුද්ගලයෙක් සමග සම්බන්ධතා පැවැත්වූ පුද්ගලයින්,
- නව කොරෝනා අසාදනයට ඇති අවදානම හේතුවෙන් නිරෝධායනය වෙමින් සිටින පුද්ගලයින්,

**5.2 ඉහත එකඳු හෝ අවස්ථාවක් සහිත සේවකයෙක් සේවා ස්ථානයේදී හමු වුවහොත් අදාල කොට්ඨාශයේ වගකිව යුතු නිළධාරියකු විසින් එම සේවකයාගේ වෛද්‍ය සෞඛ්‍ය තත්ත්ව වාර්ථාව සමග වහාම වෛද්‍ය මධ්‍යස්ථානය දැනුවත් කිරීමෙන් පසු වෛද්‍යය මධ්‍යස්ථානයෙන් ලැබෙන උපදෙස් අනුව ක්‍රියාකළ යුතු ය.**

**5.3 වරාය පිවිසුම් දොරටුවලින් ඇතුළු වන අවස්ථාවේදී සියළුම පුද්ගලයන්ගේ ශරීර උෂ්ණත්වය පරීක්ෂා කිරීම සිදුකළ යුතු අතර ෆැරන්හයිට් අංශක 99 °F (සෙල්සියස් අංශක 37.5 °C) ට වඩා වැඩි උෂ්ණත්වයක් සහිත ඕනෑම පුද්ගලයෙකු මිනිත්තු 10 ත් 15 ත් අතර කාලයක් විවේක ගැන්වීමෙන් පසු නැවත පරීක්ෂා කළ යුතුය. නැවතත් ශරීර උෂ්ණත්වය වැඩි නම් වරායට පිවිසීමට ඉඩ ලබා නොදිය යුතුය. ඉන් පසු ආරක්ෂක කොට්ඨාශය විසින් අදාල පුද්ගලයා සම්බන්ධයෙන් ගනු ලබන සියළු ම පියවර වහා ම ගත යුතු ය.**

- සේවා මුර පදනම යටතේ රාජකාරි වල නිරත වන සේවකයින්ගේ පැය 24ක කාලයක් තුළ අවස්ථා 3ක දී අදාල සේවා ස්ථානයට හෝ විවේකාගාර පරිශ්‍රයට පැමිණෙන ආරක්ෂක කොට්ඨාශයේ නිළධාරීන් විසින් ශරීර උෂ්ණත්වය මැන බැලිය යුතු ය.

**5.4 තම කොට්ඨාශය විසින් සමාජ දුරස්ථභාවය, මුඛ-නාස් ආවරණ පැළඳීම, අත් සේදීම සහ අනෙකුත් ක්‍රියා පිළිවෙත් දැඩිව අනුගමනය කරන බව සහතික කර ගත යුතුය.**

- සියළුම සේවා ස්ථාන පිරිසිදුව හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගත යුතු අතර, විශේෂයෙන් පොදු ස්ථාන කවුන්ටර (කවුළු), වැඩබිමෙහි ස්ථාන ආහාර ගැනීම සඳහා භාවිතා කර ගනු ලබන කාමර සහ තේ කාමර, කාර්යාලීය ආපන ශාලා, විවේකාගාර, වැසිකිළි සහ වෙනත් හවුලේ භාවිතා කරනු ලබන අවකාශයන් සෑම විටම පිරිසිදුව සහ සනීපාරක්ෂිතව නඩත්තු කළ යුතුය.
- විශේෂයෙන් මහජනතාව නිතර පැමිණෙන සේවා ස්ථානයන්හි සබන් හා ජලය යොදා ගනිමින් හෝ සනීපාරක්ෂක දියර අත්ලේහි පිරිමැදීම මගින් දෑත් සිරිසිදු කිරීම සඳහා පහසුකම් මනාව පෙනෙන ස්ථානයන්හි යොදවා සනීපාරක්ෂාව සඳහා ප්‍රවේශය ලබා දිය යුතුය.
- නිතිපතා සිදුකරන පවිත්‍රතා කටයුතු එනම් පිසදැමීම, පිරිසිදු කිරීම සහ සේවා ස්ථානයේ ඇති පෘෂ්ඨ, උපකරණ සහ අනෙකුත් දෑ විෂබීජහරණ කටයුතු අඛණ්ඩව සිදුකළ යුතු ය.
- දොර අගුලු සහ හැඬලයන් සෑම වැඩ මුරයකටම පෙර සහ පැය තුන කට වරක් වත් පිරිසිදු කර, විෂබීජහරණය කළ යුතුය.
- පොළව, කාර්යාලිය උපකරණ සහ ගෘහ භාණ්ඩ දිනකට දෙවරක් හෝ වැඩමුරයන් පවතින සේවා ස්ථාන වල සෑම වැඩමුරයක් අවසානයේදී පිරිසිදු කර, විෂබීජහරණය කළ යුතුය.
- අනුගමනය කළ යුතු සෞඛ්‍යමය සහ සනීපාරක්ෂක මාර්ගෝපදේශ පිළිබඳ තොරතුරු දැක්වෙන දැන්වීම් සේවකයන් සහ මහජනතාවගේ දැනගැනීම පිණිස සේවා ස්ථානයේ කැපී පෙනෙන ලෙස ප්‍රදර්ශනය කළ යුතු ය.
- සේවා ස්ථානයන්හි පිරිස ඒකරාශීවීම අවම කිරීම සඳහා හැකි සෑමවිටකදීම හා හැකිතරම් දුරට දුරස්තව කාර්යාල සේවා සැපයීම් දිරිමත් කළ යුතු ය.
- යම් සේවකයකු කොවිඩ් 19 වෛරසයට අදාල සුළු රෝග ලක්ෂණ හෝ පෙන්නුම් කරන්නේ නම් එවැනි පුද්ගලයන් නිවසේ රැඳී සිටිය යුතු බවට උපදෙස් ලබා දිය යුතුය.

**ශ්වසන රෝග ලක්ෂණ තිබේ නම්,**
**පසුගිය දින 14 තුළ රෝග අසාදනය පිළිබඳ සැක සහිත හෝ තහවුරු කළ පුද්ගලයෙක් සමග ඇසුරු කළේ නම්,**
**අවදානම හේතුවෙන් නිරෝධායනය වෙමින් සිටිනම්,**

**සේවයට වාර්තා කිරීමෙන්**
**වළකින්න**

- සියළුම කාර්යාල සේවකයින් සේවා ස්ථානයේදී පවත්වනු ලබන රැස්වීම් සඳහා සහභාගිවන පුද්ගලයින් සහ විවිධ සේවා සපයන අනෙකුත් පුද්ගලයින්ගේ නම් සහ ඔවුහු සම්බන්ධ කරගත හැකි නිවැරදි තොරතුරු පවත්වා ගෙන යා යුතු ය.
- සේවකයින් හා වරාය පරිශ්‍රය භාවිතා කරන්නන් සිය සේවා ස්ථාන වලට ඇතුළු වීමට පෙර අත් සේදීම අනිවාර්යයෙන් කළ යුතුය.
- අත් සේදීම පහසුකම් සලසනු පිණිස විෂබීජනාෂක ද්‍රව්‍ය ( Sanitizing Hand Rub Dispensers) ප්‍රධාන දොරටුවල සහ අවශ්‍යයැයි අදහස් කරන වෙනත් ස්ථානවල සපයා තිබිය යුතුය.
- සැමවිටම අත් සේදීම්කාරක (Hand Rub Dispensers) අවසන්වීමට ප්‍රථම හිඟයකින් තොරව සැපයීමට වගබලා ගත යුතුය.
- කොට්ඨාශ මට්ටමින් සේවකයින්ට ආහාරපාන ලබා දීමේ දී ආහාර බෙදීමේ සේවකයින් විසින් මුඛ-නාස් ආවරණ හා අත්වැසුම් පැළඳ ඉතා පිරිසිදුව තම කාර්යය ඉටුකළ යුතුය.
- බුෆේ ක්‍රමයට ආහාර ලබා දෙන ස්ථානයකදී පුද්ගලයන් අතර රෝගය පැතිරීම වැළක්වීම සඳහා ආහාර බෙදා දීමට කාර්ය මණ්ඩලයේ ඒ සඳහා වෙන්කළ එක් සේවකයෙක්/සේවකයන් යෙදවිය යුතුය. තවද බුෆේ එකේ තිබෙන සියලුම ආහාර අපවිත්‍ර වීම වැලැක්වීමට ආවරණය කර තැබිය යුතුය.
- සෞඛ්‍ය සහ සනීපාරක්ෂක මාර්ගොපදේශ අනුගමනය කිරීම සම්බන්ධයෙන් සේවා ස්ථානයේ තත්ත්වය නිරන්තරයෙන් පසු විපරම් කිරීම, අධීක්ෂනය කිරීම සහ තොරතුරු සැපයීම සඳහා නිළධාරියෙකු හෝ නිළධාරීන් නම් කළ යුතු අතර, ගැටළු සහගත අවස්ථා නිරාකරණයකර ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතු ය.

**5.5 මෙම රෝග ව්‍යාප්තිය වළක්වාලීම සඳහා සේවක මහත්ම/මහත්මීන්ගේ වගකීම**

- වරාය පරිශ්‍රයට ඇතුළු වන සෑම අයෙක්ම මුඛ-නාස් ආවරණයක් පැළඳිය යුතුය.

**වරාය සේවකයෙකුගේ හෝ වරාය පරිශ්‍රය භාවිතා කරන්නකුගේ ශරීර උෂ්ණත්වය අංශක 99 °F ( 37.5 °C ) ට වඩා වැඩි බව යළි යළිත් තහවුරු වන්නේ නම් වරායට පිවිසීමට ඉඩ ලබා නොදිය යුතුය.**

- වරාය පරිශ්‍රයට ඇතුලූ වන සෑම අවස්ථාවක දීම අදාළ දොරටුවේ දී තමාගේ උෂ්ණත්වය මැන බැලීමට අනිවාර්යයෙන් ඉදිරිපත් විය යුතුය.
- සේවා ස්ථානයට ඇතුළු වීමට පෙර සබන් යොදා අත් සේදිම සහ පාවහන් විෂබීජහරණය කළ පසු ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළ යුතුය.
- සේවා ස්ථානයට ඇතුළුවන සෑම අවස්ථාවකම විෂබීජ හරනයට ලක්විය යුතුය.
- සියළුම සේවකයින් රාජකාරියේ යෙදී සිටියදී මුඛ-නාස් ආවරණයක් පැළඳිය යුතු අතර ඔවුන් අතර අවම වශයෙන් මීටරයක දුරක් පවත්වා ගත යුතුය.
- සේවකයින් අන් අයගේ මේස, පොදු දුරකථන,ෆැක්ස් යන්ත්‍ර හෝ අනෙකුත් මෙවලම් සහ උපකරණ අත්‍යවශ්‍ය කරුණකදී හැර භාවිතයෙන් වැළකිය යුතුය.
- කිසියම් වස්තුවක් හුවමාරු කර ඇත්නම් එය සබන් හා ජලය හෝ අවම වශයෙන් සනීපාරක්ෂක දියරයකින් පිරිසිදු කළ යුතුය.
- සේවකයින් අතර වාචික සන්නිවේදනය අවම කිරීම සඳහා විකල්ප ක්‍රම (ශබ්ද විකාශන යන්ත්‍ර, ඉන්ටර්කොම් ආදිය) භාවිතා කළ යුතු ය.
- කොට්ඨාශ අතර සන්නිවේදන කටයුතු සඳහා විද්‍යුත් තාක්‍ෂණය උපරිම වශයෙන් භාවිතා කිරීමෙන් සේවක සේවිකාවන් අතර සිදු වන සෘජු සබඳතා අවම කිරීමට කටයුතු කළ යුතු ය.
- සේවකයින් විසින් අනවශ්‍ය ලෙස හැසිරවීම අවම කිරීම සඳහා සේවා ස්ථානයේ කොටස් අතර දොරවල් විවෘතව තැබිය යුතුය.
- නිතිපතා සිදුකරන පවිත්‍රතා කටයුතු එනම් පිසදැමීම, පිරිසිදු කිරීම සහ සේවා ස්ථානයේ ඇති පෘෂ්ඨ, උපකරණ සහ අනෙකුත් දෑ විෂබීජහරණ කටයුතු, අඛණ්ඩව සිදුකළ යුතුය.
- දිවා විවේකය සහ තේ විවේකය ලබා ගැනීමේදී සමාජ දුරස්ථභාවය තහවුරු කළ යුතුය.
- කහින විට සහ කිවිසින විට සෞඛ්‍යමත් ආකාරයට එය සිදු කළ යුතුය. කහින විට සහ කිවිසුම් යෑමේ දී වැලමිටෙහි ඇතුල් පැත්ත හෝ ඇඳුමෙහි අත මගින් ආවරණය කළ යුතුය. මෙලෙස සිදු කිරීම නොහැකි අවස්ථාවලදී, ටිෂු කඩදාසියකින් කට සහ නාසය ආවරණය කළ යුතු අතර, ඉන් පසු ටිෂු

කඩදාසිය පාදය මගින් විවර කළ හැකි සංවෘත කසල බඳුනකට බැහැර කර දෑත් පිරිසිදු කරගත යුතුය.

- ආහාර ලබා ගන්නා අතර වීදුරු කොප්ප, පිඟන් සහ වෙනත් උපකරණ හුවමාරු කර ගැනීමෙන් වළකිය යුතු ය.
- වරාය පරිශ්‍රය තුළ දුම්, මත්පැන් පානය සහ තැන තැන කෙළ ගැසීම / බුලත් කෙළ ගැසීම සපුරා තහනම් ය.
- යම් සේවකයකු දින 05ක් හෝ ඊට වැඩි දින ගණනකින් පසු සේවයට වාර්ථා කරන්නේ නම් තම කොට්ඨාශයෙන් ලබා ගත යුතු සෞඛ්‍ය තත්ත්ව වාර්ථාව පිරවිය යුතුය. එහි අංක 05 සිට 10 දක්වා කරුණු වල ප්‍රශ්න සහිත නම් වගකිව යුතු නිළධාරියා විසින් වෛද්‍ය මධ්‍යස්ථානයෙන් උපදෙස් ලබා ගත යුතු ය. ඉන් පසු වෛද්‍ය නිර්දේශ අනුව කටයුතු කළ යුතු ය.

## 5.6 සේවකයන් හට ගමනාගමන පහසුකම් සැලසීමේදී

සේවකයන් හට ගමනාගමන පහසුකම් සැලසීමේදී පහත සඳහන් විශේෂ පූර්වෝපායන් අනුගමනය කළ යුතු ය.

- සේවකයින් අතර රෝග සම්ප්‍රේෂණය වැළැක්වීම සඳහා පුද්ගලයන් ප්‍රවාහනය කිරීමට පෙර වාහන පිරිසිදු කර විෂබීජහරණය කළ යුතු ය. (ආසන, දොර අගුලු, ජනේල, ඇතුළත සහ පිටත දොර හැඬල ආදිය)
- සියලූම රියදුරු මහතුන් අත් ආවරණ සහ මුඛ ආවරණ පැළඳිය යුතුය.
- වාඩි වී සිටින විට පුද්ගලයින් අතර අවම වශයෙන් මීටර 1 ක දුරක් පවත්වා ගැනීමට හැකිවන පරිදි සේවකයින්ගේ සංඛ්‍යාව අනුව සුදුසු ආසන ධාරිතාවක් සහිත වාහනයක් තෝරා ගත යුතුයි.
- මගීන් දොරවල් හැසිරවීමේ දී අදාල සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම අනුගමනය කළ යුතුය.
- ප්‍රවාහනය කරන අතරතුර සියලුම සේවකයින් මුඛ-නාස් ආවරණ පැළඳිය යුතුය.

**සේවා ස්ථානයේ රෝගී බවට සැක සහිත පුද්ගලයෙක් හඳුනාගතහොත් කළ යුත්තේ කුමක්ද?**

## 5.7 සේවා ස්ථානයේ රෝගී බවට සැක සහිත පුද්ගලයෙක් හඳුනා ගැනීමෙන් පසු පිළිපැදිය යුතු විශේෂ උපදෙස්

- සේවා ස්ථානයේදී රෝගී බවට සැක සහිත (ශ්වසන රෝග ඇතිව හෝ නැතිව උණ ඇති) පුද්ගලයෙක් අනාවරණය වුවහොත් තම ආදාල කොට්ඨාශයේ වගකිව යුතු ඉහළ නිළධාරීයාට වහාම දැනුම් දිය යුතු ය.
- එම බලයලත් නිළධාරියා වරාය අධිකාරියේ වෛද්‍ය මධ්‍යස්ථානයේ ක්ෂණික දුරකථන අංකය (Hotline) **2343** අමතා ලැබෙන උපදෙස් අනුව කටයුතු කළ යුතුය .
- රෝගී බවට සැක සහිත පුද්ගලයා මුඛ-නාස් ආවරණය දිගටම පැළඳ සිටිය යුතු අතර අනෙකුත් සේවකයන්ගෙන් හුදකලා කළ යුතුය.
- අදාල සැක සහිත සේවකයා, අදාල සේවා ස්ථානය සහ එම ස්ථානයේ අනෙකුත් සේවකයින් ගැනත් වෛද්‍ය මධ්‍යස්ථානයේ උපදෙස් අනුව කටයුතු කළ යුතු ය.
- කොවිඩ්-19 රෝගය පාලනයට අදාලව ආයතනය තුළ ක්‍රියාත්මක කර ඇති ක්‍රියාමාර්ග, දැන්වීම් පුවරු මත ප්‍රදර්ශනය කර ඒවා පිළිපැදීම සියළු සේවකයන් ට අනිවාර්ය කළ යුතු ය.
- මෙම ස්ථාන වලට එන අමුත්තන් සීමා කළ යුතුය.

## 5.8 කොවිඩ්-19 ආසාදනය වී ඇතැයි සැක කරන පුද්ගලයෙකු භාවිත කළ ඇඳ ඇතිරිලි සහ වෙනත් රෙදිපිළි ද්‍රව්‍ය බැහැර කිරීම

- කොවිඩ්-19 ආසාදනය වී ඇතැයි සැක කරන පුද්ගලයෙකු භාවිත කළ ඇඳ ඇතිරිලි සහ වෙනත් රෙදිපිළි ද්‍රව්‍ය පැය 72ක කාලයක් වෙනම බෑග් එකක සීල් කර තැබිය යුතු ය.
- එම පුද්ගලයාගේ පරීක්ෂණ ප්‍රතිඵල වලින් රෝගය නැති බවට තහවුරු වුවහොත් එම ද්‍රව්‍ය

සාමාන්‍යයෙන් ඇඳ ඇතිරිලි සහ වෙනත් රෙදිපිළි ද්‍රව්‍ය සෝදන ආකාරයට පිරිසිදු කර ගත හැකි වන අතර පුද්ගලයාගේ පරීක්ෂණ ප්‍රතිඵල වලින් රෝගය තිබෙන බවට තහවුරු වුනොත් එම ඇඳ ඇතිරිලි සහ වෙනත් රෙදිපිළි ද්‍රව්‍ය දාහකයක් තුළ දහනය (Incineration) කළ යුතු ය.

එම ද්‍රව්‍ය හසුරුවන පුද්ගලයින් N 95 මුඛ ආවරණ, ඇස් ආවරණ,සම්පූර්ණ ශරීරය ආවරණය වන පරිදි භාවිත කරන ආරක්ෂක ඇඳුම් (Coverall) හා අත්වැසුම් පැළඳිය යුතු අතර, ඒවාද පසුව දහකයක් තුළ දහනය කළ යුතු ය.

### 5.9 නේවාසිකාගාර, බැරැක්ක සහ විවේකාගාර

- නවාතැන්පල තුළ තදබදය වළක්වා ගැනීමට හැකි සෑම පියවරක්ම ගත යුතුය. පරිශ්‍රයට ඇතුළු වන සෑම කෙනෙකුම සබන් යොදා අත් සේදිය යුතුය. නැතහොත් දෑත් පිරිසිදුකාරකයක් භාවිතා කළ යුතුය.
- සෙරෙප්පු / සපත්තු දොරටුවෙන් පිටත හෝ අවම වශයෙන් කාමරයෙන් පිටත තබා ගත යුතු ය.
- ආහාර ගැනීමේ ස්ථානවල හෝ ආපනශාලාවල තදබදය වළක්වා ගැනීම සඳහා කුඩා කණ්ඩායම් ලෙස විවිධ කාලවලදී ආහාර ගැනීමට පිළියෙළ කළ යුතුය. සෑම විටම පුද්ගලයින් අතර මීටරයක දුරක් පවත්වා ගත යුතු ය.

### 5.10 සේවය නිමා කළ පසු

- තම රාජකාරී අවසන් කර නික්ම යෑමේ දී සබන් යොදා අත් සේදීම හා පාවහන් විෂබීජහරණය කළ යුතු ය.
- අත්‍යවශ්‍ය සේවා පදනම යටතේ අඛණ්ඩව සේවයේ යෙදී සිට ඉන් මිදී යන සේවකයන් විසින් නිසි පරිදි සම්පූර්ණ කර ඉහළ නිළධාරියාගේ අනුමැතිය ලබා ගත් සටහන් පත්‍රිකාව අවශ්‍ය අවස්ථාවක දී සෞඛ්‍ය සේවා නිළධාරීන් හෝ ආරක්ෂක නිළධාරීන් වෙත ඉදිරිපත් කිරීම සඳහා ළඟ තබා ගත යුතු ය.

### 5.11 සේවය නිමවා නිවසට ගිය පසු/යළි සේවයට පැමිණීමේදී

- සේවයෙන් මිදුණු පසු හැකි ඉක්මණින් නිවස වෙත යා යුතු අතර, අතර මග නොරැඳෙමින් බාහිර පුද්ගලයන්ට නිරාවරණය නොවීමට වග බලා ගත යුතු ය
- නිවස වෙත ගිය පසු තමන් හැඳ පැළැඳ සිටින ඇඳුම් ආදිය සෝදා පිරිසිදු කර තමන්ද ස්නානය කර පිරිසිදු වී නිවස තුළ ට යා යුතු ය.
- තමන් පරිහරනය කල දුරකතනය, යතුරු කැරලි, මුදල් පසුම්බිය, ඔරලෝසුව , ගමන් බෑගය යනාදිය විෂබීජානුහරණය කර නිවස තුළට ගත යුතු ය.
- පාවහන් ද විෂබීජානුහරණය කර නිවසින් පිටත සුදුසු ස්ථානයක තැබිය යුතු ය.
- නිවසට ගිය පසු ඔබ හෝ නිවසේ සමාජිකයින් කිසිවෙකු භාහිරට නිරාවරණය වීම අවම කරන්න අත්‍යවශ්‍ය කරණකට හැර නිවසින් පිටතට යාමෙන් වැළකී සිටිය යුතු ය.
- අත්‍යවශ්‍ය හේතුවකට හෝ නිවසින් බැහැරව ගිය හොත් ආපසු නිවසට පැමිණීමට ප්‍රථම ඉහත සඳහන් උපදෙස් අනුව කටයුතු කළ යුතු ය.
- ඔබ නිවසින් බැහැරව නොයනවා සේම භාහිර පුද්ගලයින් කිසිවෙකුවත් ඔබ නිවසට කැඳවා ගැනීමෙන් හෝ කිසිවෙකුටත් නවාතැන් පහසුකම් ලබාදීමෙන් වැළකිය යුතු ය.
- නිවසේ රැඳී සිටිය දී සහ අත්‍යවශ්‍ය වුවමණාවක් සඳහා නිවසින් බැහැරව යන්නේ නම් සෞඛ්‍යරක්ෂණ ක්‍රමවේදයන් අනිවාර්යෙන් ම පිළිපැදිය යුතු ය. (මුඛ-නාස් ආවරණ පැළඳීම, සමාජ දුරස්ථභාවය තබා ගනිමින් කටයුතු කිරීම, නිතර දෙඅත් පිරිසිදුකර ගැනීම)
- නිවසේ සිට ආපසු සේවා ස්ථානය වෙත පැමිණීමේ දී තමන් ද පිරිසිදු වී පිරිසිදු ඇඳුම් පැළඳුම්වලින් සැරසී පැමිණිය යුතු අතර රාජකාරී සඳහා පැමිණීමේදී ද අතරමග නොරැඳී ඉඳුරා ම සේවා ස්ථානය වෙත පැමිණීමට කටයුතු කළ යුතු ය.
- නිවසේ ගත කරන කාලය තුළ තමන්ට උණ, සෙම්ප්‍රතිශ්‍යාව, කැස්ස වැනි රෝග තිබුණහොත් සේවයට පැමිණීමෙන් වැළකී සිටිය යුතු අතර ඒ පිළිබඳව අදාල කොට්ඨාශ ප්‍රධානියා වෙත දැනුම් දිය යුතු ය.

# 06. සේවයට වාර්තා කිරීමට පෙර නිරෝධායන ඇඳිරිනීතිය පනවා ඇති හෝ/සහ හුදකලා ප්‍රදේශ ලෙස නම්කර ඇති ප්‍රදේශවල සිට පැමිණෙන සේවකයන් විසින් සම්පූර්ණ කළ යුතු පත්‍රිකාව

**<u>වරාය පරිශ්‍රය වෙත ඇතුළුවන පුද්ගලයින්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ තත්ත්ව වාර්තාව</u>**

1. නම :- ................................................
2. ජා.හැ.අංකය :- .................... සේවා අංකය:- .................... පරිගණක අංකය:- ....................
3. ජංගම දුරකතන අංකය :- .................... දුරකතන අංකය : ....................
4. ආයතනයේ නම :- ................................................
   ආයතනයේ ලිපිනය :- ................................................
5. ඔබගේ ස්ථිර ලිපිනය:- ................................................
6. ඔබ දැනට පදිංචි ලිපිනය:- ................................................
7. ඔබ මනා සෞඛ්‍ය තත්වයකින් පසුවන්නේද ? :- ................................................
8. ඔබට කිසියම් සෞඛ්‍යය අපහසුතාවයක් තිබේද? :- ................................................
9. ඔව් නම් එම විස්තර සදහන් කරන්න:- ................................................

   ................................................

10. අසනීප තත්ත්වයේ පසුවන කිසිවෙකු නිවසේ සිටීද? :- ................................................
    ඔව් නම් එම විස්තර සදහන් කරන්න:- ................................................
11. ඔබ පදිංචි ලිපිනයට අදාලව ආසන්නතම නිවෙස්වල ඔබ දන්නා තරමින් COVID 19 වෛරසය ආසාදිතයෙකු හෝ නිරෝධායනට ලක් වූ අයෙකු ඇති / නැති බව :- ................................................
    ඇත්නම් විස්තර සදහන් කරන්න. :- ................................................

    ................................................

    ................................................

12. ඔබ අසනීපව සිටින අයෙකු සමඟ සම්බන්ධකම් පවත්වා තිබේද? එසේනම් විස්තර සදහන් කරන්න:-

    ................................................

13. ඔබ මෑතකදී කිසියම් විශාල රැස්වීමකට / සුහද හමුවකට සහභාගී වී තිබේද :- ................................................
    එසේනම් ඒ පිළිබද විස්තර:- ................................................
14. ඔබ / ඔබගේ නිවසියන් / ඥාතීන් / අසල්වැසියන් ,
    - COVID -19 වෛරසය අසාදිත තත්ත්වයේ ඇත / නැත:- ................................................
    - PCR පරීක්ෂණ වලට ලක්කර ඇත/නැත:- ................................................
      ඇත්නම් විස්තර සදහන් කරන්න. :- ................................................
15. ඔබගේ ඥාතීන් හෝ අසල්වැසියන් නිරෝධායනයට ලක්කර ඇත්ද:- ................................................
16. ඔබ මෑතක රජය විසින් සීමාකරන ලද වසංගත නිරෝධායන ඇඳිරිනීති ප්‍රදේශයකට ගොස් තිබේද?:- ......
    එසේනම් එම ප්‍රදේශයේ නම ? :- ................................................
17. විදේශගතව සිටි අයෙකු මෑතක ඔබ හමුවී හෝ ඔබ නිවසට පැමිණ ඇත්ද:- ................................................
    එසේ පැමිණියේ හෝ හමුවුයේ නම් එම පුද්ගලයින් පිළිබද විස්තර :- ................................................

    ................................................

    ඉහත සදහන් තොරතුරු නිවැරදි හා සත්‍ය කරුණු බවට මා සහතික වෙමි.

................................................ ................................................

අත්සන            දිනය

**ප්‍රදේශය අයත් ග්‍රාම නිළධාරිවරයා / මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා ගේ නිර්දේශ සටහන :-**

................................................

ඉහත විස්තර සදහන් සේවකවරයා නිරෝධායනයට ලක්කර සිටි පුද්ගලයෙකු ද? ................................................

ඉහත සේවකවරයාගේ සමීපතයින් කිසිවෙක් නිරෝධායනයට ලක්කර සිටියේද? ................................................

සමීප අසල්වැසි නිවෙස් කිසිවක් නිරෝධායනයට ලක්කර තිබේද ? ................................................

වෙනත් කරුණු කිසිවක් වේ නම් ? ................................................

................................................ ................................................

අත්සන            දිනය

ඉහත පත්‍රිකා භාගත කර ගැනීම සඳහා www.slpa.lk හෝ news.slpa.lk වෙබ් අඩවි හෝ පහත දැක්වෙන QR කේත භාවිතා කරන්න.

සිංහල      දෙමළ      ඉංග්‍රීසි

# 07. සේවයට වාර්තා කිරීමට පෙර නිරෝධායන ඇදිරිනීතිය පනවා නැති හෝ/සහ හුදකලා ප්‍රදේශ ලෙස නම්කර නැති ප්‍රදේශවල සිට පැමිණෙන සේවකයන් විසින් සම්පූර්ණ කළ යුතු පත්‍රිකාව

**<u>වරාය පරිශ්‍රය වෙත ඇතුළුවන පුද්ගලයින්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ තත්ත්ව වාර්තාව</u>**

1. නම :- ......
2. ජා.හැ.අංකය :- ...... සේවා අංකය:- ...... පරිගණක අංකය:- ......
3. ජංගම දුරකතන අංකය :- ...... දුරකතන අංකය : ......
4. ආයතනයේ නම :- ......
   ආයතනයේ ලිපිනය :- ......
5. ඔබගේ ස්ථිර ලිපිනය:- ......
6. ඔබ දැනට පදිංචි ලිපිනය:- ......
7. ඔබ මිනා සෞඛ්‍ය තත්වයකින් පසුවන්නේද ? :- ......
8. ඔබට කිසියම් සෞඛ්‍යය අපහසුතාවයක් තිබේද? :- ......
9. ඔව් නම් එම විස්තර සඳහන් කරන්න:- ......
   ......
10. අසනීප තත්ත්වයේ පසුවන කිසිවෙකු නිවසේ සිටීද? :- ......
    ඔව් නම් එම විස්තර සඳහන් කරන්න:- ......
11. ඔබ පදිංචි ලිපිනයට අදාලව ආසන්නතම නිවෙස්වල ඔබ දන්නා තරමින් COVID 19 වෛරසය ආසාදිතයෙකු හෝ නිරෝධායනට ලක් වූ අයෙකු ඇති / නැති බව :- ......
    ඇත්නම් විස්තර සඳහන් කරන්න. :- ......
    ......
    ......
12. ඔබ අසනීපව සිටින අයෙකු සමඟ සම්බන්ධකම් පවත්වා තිබේද? එසේනම් විස්තර සඳහන් කරන්න:-
    ......
    ......
13. ඔබ මෑතකදී කිසියම් විශාල රැස්වීමකට / සුහද හමුවකට සහභාගී වී තිබේද? :- ......
    එසේනම් ඒ පිළිබඳ විස්තර:- ......
    ......
14. ඔබ / ඔබගේ නිවසියන් / ඥාතීන් / අසල්වැසියන් ,
    - COVID -19 වෛරසය අසාදිත තත්ත්වයේ ඇත / නැත:- ......
    - PCR පරීක්ෂණ වලට ලක්කර ඇත/නැත:- ......

    ඇත්නම් විස්තර සඳහන් කරන්න. :- ......
15. ඔබගේ ඥාතින් හෝ අසල්වැසියන් නිරෝධායනයට ලක්කර ඇත්ද:- ......
16. ඔබ මෑතක රජය විසින් සීමා කරන ලද/වසංගත නිරෝධායන ඇදිරිනීති ප්‍රදේශයකට ගොස් තිබේද?
    :- ......
    එසේනම් එම ප්‍රදේශයේ නම ? :- ......
17. විදේශගතව සිටි අයෙකු මෑතක ඔබ හමුවී හෝ ඔබ නිවසට පැමිණ ඇත්ද:- ......
    එසේ පැමිණියේ හො හමුවූයේ නම් එම පුද්ගලයින් පිළිබඳ විස්තර :- ......
    ......

ඉහත සඳහන් තොරතුරු නිවැරදි හා සත්‍ය කරුණු බවට මා සහතික වෙමි.

**සේවක,**

...................................... ......................................

අත්සන දිනය


ඉහත පත්‍රිකා භාගත කර ගැනීම සඳහා www.slpa.lk හෝ news.slpa.lk වෙබ් අඩවි හෝ පහත දැක්වෙන QR කේත භාවිතා කරන්න.

සිංහල

දෙමළ

ඉංග්‍රීසි

# 08. සේවයට වාර්තා කිරීමේ දී/ සේවයෙන් නික්ම යෑමේ දී සේවකයන් විසින් සම්පූර්ණ කළ යුතු පත්‍රිකාව



ශ්‍රී ලංකා වරාය අධිකාරිය
කොළඹ වරාය

අඛණ්ඩ අත්‍යාවශ්‍ය සේවා

සේවයේ යෙදීම / සේවයෙන් මිදියාම සනාථ කිරීම
(නිලධාරී / සේවකවරයා සන්තකයේ තබා ගැනීම සඳහා)

නම -

සේවක අංකය -

ජාතික හැඳුනුම්පත් අංකය -

තනතුර -

කොට්ඨාශය -

සේවා මුරය ආරම්භ කල
දිනය - වේලාව -

සේවා මුරය අවසන් කල
දිනය - වේලාව -

කළමණාකරු /රාජකාරී භාර නිලධාරීගේ /තදාසන්න
ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ අත්සන සහ නිලමුද්‍රාව

වෙනත්

Medical Division
Sri Lanka Ports Authority
Port of Colombo

ඔබේත් මගේත් ආරක්ෂාව සඳහා



නිරතුරුව මුව ආවරණ පළඳින්න



# කොට්ඨාශ සහ අනෙකුත් සේවා සඳහා විශේෂ වූ වත් පිළිවෙත්

# ආරක්ෂක කොට්ඨාශය

ඉහත සඳහන් පොදු කරුණු වලට අමතරව ආරක්ෂක කොට්ඨාශයේ සේවය කරන සියළු ම නිළධාරීන් හා සේවක මහත්ම මහත්මීන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පහත දැක්වේ.

### සේවා මුර පදනම

ආරක්ෂක කොට්ඨාශයේ සියළුම ආරක්ෂක නිළයන් වෙත දින හතක සේවා මුර ක්‍රමයක් තාවකාලිකව හඳුන්වා දී ඇති අතර, සියළුම කලාප, අංශ, ඒකකවලට අනුයුක්ත ආරක්ෂක නිළයන් කුඩා ඒකකවලට වෙන්කර රාජකාරි කටයුතු පවත්වා ගෙන යනු ලැබේ.

### ආරක්ෂක කොට්ඨාශය යටතේ රාජකාරි නිරත අයවළුන්ගේ පුද්ගලික සෞඛ්‍ය ආරක්ෂක මෙවලම්/ ඇඟළුම්



**ඉහළ අවදානම් රාජකාරි**

අවශ්‍යතා අනකූලව ජ්‍යෙෂ්ඨ රාජකාරි භාර නිළධාරී/ රාජකාරි භාර නිළධාරීවරුන් විසින් මෙම ඇඟළුම් කට්ටල නිකුත් කරනු ඇත.

- සම්පූර්ණ ඇඟළුම
- අක්ෂි ආවරණ
- මුඛ-නාස් ආවරණ
- ශල්‍ය අත්වැසුම්
- පැවහන් ආවරණ

(වරක් භාවිතයෙන් පසු ආරක්ෂිතව ඉවතලීම සිදු කළ යුතු ය)



**අවදානම් රාජකාරි - I**

භාවිතයෙන් පසු සබන් යොදා සෝදා, හිරු රශ්මියෙන් වේලා, නැවත භාවිතයට ගත හැකි ඇඟළුම් කට්ටලය

- ආරක්ෂක ඇඟළුම
- අක්ෂි ආවරණ
- ආරක්ෂිත හිස්වැසුම
- මුඛ-නාස් ආවරණ
- රබර් අත්වැසුම්
- රබර් (ගම්බූට්) පාවහන්



**අවදානම් රාජකාරි - II**

සාමාන්‍ය ආරක්ෂක නිල ඇඳුම සමගින්

- අක්ෂි ආවරණ කොටස සහිත ආරක්ෂිත හිස්-වැසුම
- මුඛ-නාස් ආවරණ
- රබර් අත්වැසුම්

භාවිතයෙන් පසු: සබන් යොදා සෝදා නැවත භාවිතයට ගත හැකි ය.



**ක්ෂේත්‍ර රාකාරි/ සාමාන්‍ය කාර්යාල රාජකාරි**

සාමාන්‍ය ආරක්ෂක නිල ඇඳුම/ සිවිල් ඇඳුම සමගින්

- මුඛ-නාස් ආවරණ

(භාවිතයෙන් පසු සබන් යොදා සෝදා නැවත භාවිතයට ගත හැකි ය.)

# ක්‍රියාකරවන කොට්ඨාශය

ඉහත සඳහන් සියලුම පොදු කරුණු වලට අමතරව ඔබගේ සේවා ස්වභාවයට අදාලව අවධාරණය කර තිබෙන පහත උපදෙස් පිළිපැදීමට කටයුතු කළ යුතුය. ඔබ විසින් භාවිතා කරනු ලබන පුද්ගලික දෑ ආරක්ෂිතව හුදකලාව තබාගැනීමට කටයුතු කල යුතුය.

**නැව් මත/ නෞකා අද්දර සේවයේ යෙදෙන නිලධාරීන්/ සේවක කණ්ඩායම් සඳහා විශේෂ වූ කරුණු (කාර්යය හර්ය කළමනාකරුවන්/ නිළධාරීන්/ පරිපාලක නිළධාරීන්/ සහකාර අධිකාරිවරුන්/ සංඥාකරුවන්/ ලැෂින් කණ්ඩායම්)**

- පුද්ගල ආරක්ෂිත උපකරණ (හිස් වැසුම, මුඛ-නාස් ආවරණය, අත් වැසුම්, ආරක්ෂිත සපත්තු කට්ටලය) පැළඳ සිටිය යුතුය.
- නාවික කාර්ය මණ්ඩලය සමග සෘජු සබඳතා නොපවැත්විය යුතු ය. සෑම විටකම දුරස්ථ සන්නිවේදන ක්‍රම භාවිතා කළ යුතු ය.
- පොදුවේ භාවිතා කරනු ලබන සන්නිවේදන උපකරණ, ලියකියවිලි ඇතුළු සියලු දෑ පිරිසදු කරගැනීමෙන් අනතුරුව භාරගැනීම සහ නැවත භාරදීම සිදු කළ යුතු ය.
- අත්වැටවල් හා ඉණිමං වැනි දෑ ස්පර්ෂ කිරීමේදී සෑම විට ම අත් ආවරණ පැළඳිය යුතු ය.

**පර්යන්ත අංගනයේ සේවයේ යෙදෙන සේවක කණ්ඩායම් සඳහා විශේෂ වූ කරුණු (සහකාර අධිකාරිවරුන්, ග්‍රෑන්ට්/ජංගම දොඹකර ක්‍රියාකරුවන්, ප්‍රයිමුවර් රථ රියදුරන්, සැසඳුම්/සැලසුම් ලිපිකරුවන්, අංගන සහයකයින්, පවිත්‍රතා කටයුතු සේවකයන්, ගමන්කරවන මැදිරි සේවකයන්, ආම්පන්න ගබඩා සේවකයින්, අන්තර් පර්යන්ත බහළු ප්‍රයිමුවර් රථ සේවකයින්, ශීතකල බහළු අධීක්ෂණ කණ්ඩායම් සහ අනෙකුත් අංගනයේ සේවයේ නියතු අය)**

- පුද්ගල ආරක්ෂිත උපකරණ (හිස් වැසුම, මුඛ-නාස් ආවරණය, අත් වැසුම්, ආරක්ෂිත සපත්තු කට්ටලය) පැළඳ සිටිය යුතුය.
- රිය හා දොඹකර මැදිරි තුළට වාතාශ්‍රය ලැබීමට කටයුතු සැලසිය යුතුය.
- ස්පර්ෂ කෙරෙන සියලුම ලීවර විෂබීජ නාශක ද්‍රව්‍ය යොදා පිරිසිඳු කළ යුතු ය.
- පොදුවේ භාවිතා කරනු ලබන සන්නිවේදන උපකරණ, ලියකියවිලි ඇතුළු සියලු දෑ පිරිසිදු කරගැනීමෙන් අනතුරුව භාරගැනීම සහ නැවත භාරදීම සිදු කළ යුතු ය.
- තේ විවේකයට පෙර සබන් යොදා දෑත් හොඳින් සෝදා ගත යුතු ය.
- මුඛ-නාස් ආවරණය සහ අත් වැසුම් ඉවත් කිරීමේදී සැලකිලිමත් විය යුතු ය. ඒවා වෙනත් දෑ සමග ස්පර්ෂ නොකොට විෂබීජ නාශක ද්‍රව්‍ය යොදා පිරිසිදු කළ යුතු ය.

**සේවා මුර පදනම**

කොරෝනා වසංගතය පවතින කාලය තුළ ජය බහලු පර්යන්තයේ රාජකාරි සඳහා තාවකාලික මුර පදනම මත සියළුම සේවකයින්ගේ ආරක්‍ෂාව තහවුරු කර ගනිමින් අඛණ්ඩව මෙහෙයුම් පවත්වා ගැනීම සඳහා විශේෂ වැඩපිලිවෙළක් හඳුන්වා දී ඇත.

විධායක නිලධාරීන් සහ කාර්යාල ගනයේ සේවකයින් සේවා අවශ්‍යතාවය මත පමණක් රාජකාරි සඳහා යෙදවිය යුතුය.

තාවකාලිකව හඳුන්වා දී ඇති මුර පදනම මත මෙහෙයුම් ගණයේ සියලුම සේවකයින් සේවයට වාර්තා කිරීම සහ පිටවීම කොට්ඨාශයෙන් ලබා දෙන විශේෂ උපදෙස් මත සිදු විය යුතු ය.

සේවා මුර දෙකක් යටතේ එනම් ඒ මුරය සහ බී මුරය ලෙස මෙහෙයුම් ගනයේ සේවකයින් කණ්ඩායම් දෙකක් ලෙස සේවයේ යෙදවිය යුතු ය.

හැකි සෑම මෙහෙයුම් උපකරණයක් සඳහාම සේවකයින් දෙදෙනෙකු යෙදවිය යුතුය.

| සේවක වර්ගය | භාවිතා කරන උපකරණය | වැඩ ස්ථානය | පැළඳිය යුතු පුද්ගලික ආරක්ෂිත උපකරණ |
|---|---|---|---|
| ග්‍රැන්ට්‍රි දොඹකර ක්‍රියාකරුවන් | ග්‍රැන්ට්‍රි දොඹකර/ වී.එම්.ටී. | ග්‍රැන්ට්‍රි දොඹකර කැබින් එක | මුඛ-නාස් ආවරණ, අත් වැසුම්, විෂබීජ නාශක |
| ජංගම දොඹකර ක්‍රියාකරුවන් | ජංගම දොඹකරය/ වී.එම්.ටී. | ජංගම දොඹකරය කැබින් එක | මුඛ-නාස් ආවරණ, අත් වැසුම්, විෂබීජ නාශක |
| සංඥාකරුවන් | ගමන්කථන (VHF) | නැව මත | මුඛ-නාස් ආවරණ, මුහුණු ආවරණ සහිත ආරක්ෂිත හිසු වැසුම්, අත් වැසුම්, විෂබීජ නාශක |
| ප්‍රයිමුවර් රියදුරු | ප්‍රයිමුවර් රථය (වී.එම්.ටී./VMT) | ප්‍රයිමුවර් රථය | මුඛ-නාස් ආවරණ, අත් වැසුම්, විෂබීජ නාශක |
| සැසඳුම්/ සැලසුම් ලිපිකරුවන් | එච් එච් ටී | සැසඳුම්/ සැලසුම් ලිපිකරු කැබින් එක | මුඛ-නාස් ආවරණ, අත් වැසුම්, විෂබීජ නාශක |
| සහකාර අධිකාරිවරුන් (මෙහෙයුම්/ අංගන/ නෞකා/ අයි.ටී.ටී - අන්තර් පර්යන්ත බහලු) | යතුරු පැදි/ ගමන් කථනය (VHF) | නෞකා අද්දර හෝ අංගනය | මුඛ-නාස් ආවරණ, අත් වැසුම්, විෂබීජ නාශක |
| පෙරෙට්ටු පරිපාලකයින් | ගමන් කථනය VHF /පෙරෙට්ටු ලේඛනය | කාර්යාලය | මුඛ-නාස් ආවරණ, අත් වැසුම්, විෂබීජ නාශක |
| සහකාර අධිකාරි පාලන මැදිරිය | VHF පරිගණකය | කාර්යාලය | මුඛ-නාස් ආවරණ, අත් වැසුම්, විෂබීජ නාශක |
| අංගන සැලසුම්කරුවන් | VHF පරිගණකය | කාර්යාලය | මුඛ-නාස් ආවරණ, අත් වැසුම්, විෂබීජ නාශක |
| උපකරණ පාලයිකන් | VHF පරිගණකය | කාර්යාලය | මුඛ-නාස් ආවරණ, අත් වැසුම්, විෂබීජ නාශක |
| දොරටු සේවකයින් | පරිගණකය | පර්යන්ත කාර්යාලය | මුඛ-නාස් ආවරණ, අත් වැසුම්, විෂබීජ නාශක |
| අංගන සහභයකයින් / උදව් කරුවන් | එච්.එච්. ටී. | කාර්යාලය | මුඛ-නාස් ආවරණ, අත් වැසුම්, විෂබීජ නාශක |
| කාර්යාලීය රියදුරු | කාර්යාලීය වහාන | කාර්යාලය | මුඛ-නාස් ආවරණ, අත් වැසුම්, විෂබීජ නාශක |
| අහාර සේවකයින් | කෑම බඳුන් | කාර්යාලය | මුඛ-නාස් ආවරණ, අත් වැසුම්, විෂබීජ නාශක |
| යන්ත්‍ර ක්‍රියාකරවන්නන් | අඩු එසවුම් සහ බර එසවුම් යන්ත්‍ර | ආම්පන්න ගබඩාව | මුහුණු ආවරණ, අත් වැසුම්, විෂබීජ නාශක |

**සටහන -**

- අංගනයේ නෞකා අද්දර සහ සේවා කරන කාර්යාලය ඉදිරිපිට පාදයෙන් මෙහෙවිය හැකි අත් පා සෝදා ගැනීමේ පහසුකම් සැලසිය යුතුය. සබන් සහ විෂබීජහරණය කළ හැකි දියර ද්‍රව්‍ය අඛණ්ඩව සැපයිය යුතුය.
- වැඩ බිම සෑම පැය 48 කට වරක් සහ අවශ්‍යතාවය පරිදි විෂබීජහරණය කළ යුතුය.

# සේවා සැපයුම් කොට්ඨාශය

ඉහත සඳහන් පොදු කාරණා ක්‍රියාත්මක කිරීම සඳහා අනිවාර්යයෙන් කටයුතු කළ යුතු අතර සේවා සැපයුම් කොට්ඨාශය යටතේ කළමනාකරණය වන ගුදම් වල නැව් භාණ්ඩ තැම්පත් කිරීම, පවත්වාගැනීම සහ භාරදීම නිසි ක්‍රමවේදයන් යටතේ සිදු කිරීම සඳහා සේවකයින්ට මනාව උපදෙස් දිය යුතුය.

විෂබීජහරණ ක්‍රියාවලීයේදී නව භාණ්ඩ වල ස්වභාවය සහ ඒවායෙහි තත්වය සැලකිල්ලට ගත යුතු අතර භාණ්ඩ වලට හානි සිදුවීම හෝ ගින්නක් හෝ වෙනයම් අනතුරක් ඇතිවීමට ඇති ඉඩකඩ කෙරෙහි දැඩි පරීක්ෂාකාරීව සහ ඉහළ කලමනාකාරීත්වයේ උපදෙස් මත පමණක් කටයුතු කළ යුතුය.

ගුදම්වලට අනවසර පුද්ගලයින් කිසිවෙකුට ඇතුල් වීමට ඉඩ නොදිය යුතු අතර ගුදම් වල සේවා කළ යුත්තේ නිරාපද නිලධාරීන් සහ සේවකයින් පමණි.

# වෛද්‍ය කොට්ඨාශය

ඉහත සඳහන් සියලුම පොදු කාරණා පිළිපැදිය යුතු ය.

වෛද්‍ය නිළධාරීන්ද ඇතුළුව සියළුම කාර්යමණ්ඩලය රෝගීන් සමග සෘජු සම්බන්ධතා පවත්වන අවස්ථාවන් හී දී සම්පූර්ණ පුද්ගලික ආරක්ෂිත උපාංග පැළඳිය යුතු ය.

ආසාදිත පුද්ගලයකුට නිරාවරණය වු අවස්ථාවක දී තමා භාවිතා කරන ආරක්ෂිත අයිතමයන් නිසි පරිදි විෂබීජානුහරණයට ලක් කර ආරක්ෂිතව ඉවත් කළ යුතු ය.

රෝගියෙකු හෝ/සහ සැක සහිත ආසාදිතයෙකු රැගෙන ගිය පසු ගිලන් රථය විෂබීජහරණය කළ යුතු ය.

වෛද්‍ය උපදෙස් ලබා ගැනීමට වෛද්‍ය මධ්‍යස්ථානයට පැමිණෙන සියළුම අයවලුන් කොවිඩ්-19 වැළඳුණු රෝගීන් යැයි සලකා ඔවුන් සමග කටයුතු කිරීමේ දී සියළු ම ආරක්‍ෂක ක්‍රම අනුගමනය කළ යුතු ය.

ආසාදිතයින් හෝ/සහ සැක සහිත ආසාදිතයින් වෙන් කර තබන කාමරය හා එහි සියළුම භාණ්ඩ ක්‍රමවත් ව විෂබීජහරණය කළ යුතු ය.



වෛද්‍ය නිළධාරීන්ද ඇතුළුව සියළුම කාර්යමණ්ඩලය රෝගීන් සමග සෘජු සම්බන්ධතා පවත්වන අවස්ථාවන් හී දී පැළඳ සිටිය යුතු සම්පූර්ණ පුද්ගලික ආරක්ෂිත උපාංග.

# තොරතුරු පද්ධති කොට්ඨාශය

### සේවා මුර පද්නම

සේවකයින් කණ්ඩායම් තුනකට වෙන් කොට ඇති අතර සේවා මුර දෙකක් යටතේ රාජකාරී සිදුකරනු ලැබේ.

**තොරතුරු පද්ධති කොට්ඨාශයේ සේවකයින් විසින් පිලිපැදිය යුතු විශේෂ උපදෙස්**

නැව් නියෝජිතයින් සහ බහළු නියෝජිතයන් ගෙන් ලබා ගන්නා සහ ලබා දෙන දත්ත සහ තොරතුරු හැකි සෑම අවස්ථාවකදීම විද්‍යුත් ක්‍රම භාවිතයෙන් සිදු කිරීමට කටයුතු කළ යුතුය.

# නාවික කොට්ඨාශය

### සේවා මුර පදනම

තාවකාලිකව හඳුවා දී ඇති සේවා මුර පදනමට අනුව සේවකයින් කණ්ඩායම් දෙකකට වෙන් කොට ඇති අතර එක් කණ්ඩායමක් දින 07 ක අඛණ්ඩව සේවයේ යෙදිය යුතු ය.

### නාවික කොට්ඨාශයේ සේවකයින් විසින් පිලිපැදිය යුතු විශේෂ උපදෙස්

නාවික කොට්ඨාශයේ කාර්ය මණ්ඩලයේ සේවකයින් දින 07 ක් පුරා අඛණ්ඩව සේවය කරන බැවින් දෛනිකව කරනු ලබන විෂබීජානුහරණයට අමතරව දින හතේ සේවා මුරය අවසන් වූ විගසම විවේකාගාර/ සේවා ස්ථාන පූර්ණ විෂබීජානුහරණයට ලක් කළ යුතුය.

### නියමු නිළධාරීන්

a. පහත සඳහන් පෞද්ගලික ආරක්ෂිත උපාංග පැළඳිය යුතුය.
   - මුඛ-නාස් ආවරණ
   - අත් ආවරණ
   - ආරක්ෂිත කණ්ණාඩි (Goggles)

b. නෞකාවක් රුගෙන ඒමට යෑමට පෙර අදාල නෞකාවට පිවිසීමට වරාය සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීන්ගේ අනුමැතිය ලැබී ඇත්දැයි තහවුරු කරගත යුතු ය.

c. නෞකාව රැගෙන ඒමට නියමු යාත්‍රාවට පිවිසීමට පෙර එම යාත්‍රාව දෛනිකව විෂබිජානුහරණය කර ඇත්දැයි තහවුරු කර ගත යුතු ය.

### නෞකා ඇදීමේ කණ්ඩායම (Mooring Crew)

- නෞකාවක් රැඳවීමට යෑමට පෙර පෞද්ගලික ආරක්ෂණ උපාංග පැළඳිය යුතු අතර රාජකාරි නිමාවෙන් පසු නියමු ස්ථානයට පැමිණි විට සබන් යොදා හොඳින් අත් සෝදා ගැනීමට කටයුතු කළ යුතු ය.

### ටග් යාත්‍රා කාර්ය මණ්ඩල

- සේවයට වාර්තා කිරිමේදී පොදු උපදෙස් පිළිපැදිය යුතු අතර විශේෂයෙන්ම ටග් යාත්‍රාවට ගොඩ වීමේ දී තම පාවහන් විෂබීජානුහරණය කළ යුතු ය.
- ටග් යාත්‍රාවේ පොදු පරිහරණයට ලක්වන ස්ථාන හා උපාංග නිරන්තරයෙන්ම විෂබීජානුහරණය කළ යුතු ය.



# සුභ සාධක හා කාර්මික සබඳතා කොට්ඨාශය

ඉහත සඳහන් සියලූම පොදු කාරණා පිළිපැදිය යුතු ය.

**මුළුතැන්ගෙයි කාර්ය මණ්ඩලය**

- සියලුම අරක්කැමියන් සහ සහකාර කාර්ය මණ්ඩලය ආහාර පරිහරණයට පෙර හොඳින් දෑත් පිරිසිදු කළ යුතු ය.
- සියලුම නොපිසන ලද එළවළු සහ පලතුරු පිළියෙළ කිරීමට පෙර ඉතා හොඳින් සෝදා පිරිසිදු කළ යුතු ය.
- කෑමට සුදානම් ආහාර බෙදන විට අත් වැසුම් හෝ හොඳින් පිරිසිදු කළ ආහාර අල්ලන අඬු (tongs) භාවිතා කරන්න.
- ආහාර පිළියෙළ කරන මේස, කපන ලෑල්ල, පිහි, ආහාර අල්ලන අඬු (tongs) වැනි කෙළින්ම ආහාර සමග ගැටෙන ස්ථාන හා සියළුම උපකරණ සෑම ආහාර පිළියෙළ කරන වාරයකදීම සබන් යොදා හොඳින් පිරිසිදු කළ යුතු ය.
- සියළුම ආහාර තාවකාලිකව හෝ කිසියම් ආකාරයකින් ගබඩා කිරීමේදී සහ ප්‍රවාහනය කිරීමේ දී, ආවරණය කිරීමෙන් හෝ සීල් කිරීමෙන් පසුව පමණක් සිදු කළ යුතු ය.

**අවන්හල් සහ ආපනශාලා**

- ඉහත තුන් වන පරිච්ඡේදයේ විස්තර කර ඇති පොදු පියවරයන්ට අමතරව පහත සඳහන් විශේෂිත පියවරයන් අනුගමනය කළ යුතු ය.
- වරක් භාවිතයෙන් පසු පුටු සහ මේසවල සියලු පෘෂ්ඨයන් විෂබීජහරණය කළ යුතුය.
- සියලුම සේවකයින් සහ පාරිභෝගිකයින් අවන්හල් සහ ආපනශාලා තුළ අවම වශයෙන් මීටර් 1 ක දුරක් පවත්වා ගත යුතුය.ගෘහ භාණ්ඩ ඒ අනුව සකස් කළ යුතු ය.
- පාරිභෝගිකයින් පිඟන්, කෝප්ප, හැඳි, ගෑරප්පු, පිහි ආදී උපකරණ හවුලේ භාවිතා නොකළ යුතු ය.
- සියලුම වේටර්වරුන් විෂබීජ පැතිරීම වැළැක්වීම සඳහා නිතරම අත් සේදිය යුතු ය.
- පිඟන් කෝප්ප හැඳි, ගෑරුප්පු, පිහි ආදී උපකරණ සහ සියලුම ආහාර පිළියෙළ කිරීමට භාවිතා කරනු ලබන උපකරණ සබන් යොදා හොඳින් සේදිය යුතු ය.

# ඉංජිනේරු කොට්ඨාශය

මෙහි දැක්වෙන සියලුම පොදු කරුණු වලට අමතරව පහත සඳහන් විශේෂ කරුණු කෙරෙහි ඉංජිනේරු කොට්ඨාශයේ සියළු දෙනාගේ ම අවධානය යොමු කොට ඒ අනුව කටයුතු කළ යුතු ය.

- වැඩ බිමට පැමිණීමේ දී පහසු හා සුදුසු ඇඳුමකින් සැරසී සිටිය යුතු ය.
- වෙනත් වැඩ බිමකට ගොස් නැවත පැමිණීමේ දී දෑත්, දෙපා, විෂබීජහරණය කළ යුතු අතර, එම ස්ථානයේ රැඳී සිටින සෑම අවස්ථාවක ම දුරස්ථභාවය පිළිපැදිය යුතු අතර, මුඛ-නාස් ආවරණ, පැළැඳ සිටිය යුතු ය.
- පොදුවේ පරිහණය කරනු ලබන උපකරණ යන්ත්‍ර සූත්‍ර, ආයුධ පරිහරණයෙන් පසුව පිරිසිදු කළ යුතු ය.
- වැඩ බිමේ දී සේවක මුණ ගැසීම්, පිළිසඳර අවම කොට අත්‍යවශ්‍ය රාජකාරි කටයුතු සඳහා සීමා කළ යුතු ය.


## 10. පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව

- වරාය පරිශ්‍රය තුළ භෞතිකව විෂබීජහරණ කටයුතු පහත ආයතන මගින් අවශ්‍යතා අනුකූලව සිදු කරනු ලැබේ.
  - මහජන සෞඛ්‍ය පරීක්ෂණ අංශය - සිවිල් ඉංජිනේරු කොට්ඨාශය
  - මුහුදු නිර්මාණ අංශය - සිවිල් ඉංජිනේරු කොට්ඨාශය
  - හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම - ආරක්ෂක කොට්ඨාශය
  - රසායනික/ජීව විද්‍යාත්මක/විකිරණශීලී ද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමේ ඒකකය - ශ්‍රී ලංකා නාවික හමුදාව
- පිරිසිදු කිරීමේ රාජකාරියේ යෙදී සිටියදී සියළුම කාර්ය මණ්ඩලය සුදුසු පුද්ගලික ආරක්ෂණ උපකරණ පැළඳිය යුතු ය. (මුඛ-නාස් ආවරණ, ජල ප්‍රතිරෝධී ඒප්‍රන්, රබර් (කාර්මික) අත්වැසුම් ආදිය)
- සෑම පිරිසිදු කිරීමේ ක්‍රියාවලියෙන් පසුව ඔවුන් සබන් යොදා අත් සේදීම හෝ දෑත් විෂබීජහරණය කළ යුතු ය. (කාර්යාල කාමර, නාන කාමරය, ඉදිරිපස මේසය, වාහන ආදිය පිරිසිදු කිරීමෙන් පසු)
- කොවිඩ්-19 රෝගය යැයි සැක සහිත පුද්ගලයාගේ අපද්‍රව්‍ය හසුරුවන පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩල සාමාජිකයා සම්පූර්ණ පුද්ගලික ආරක්ෂක ආම්පන්න පැළඳිය යුතු ය.
- ඔවුන් සෑම විටම එකිනෙකා සමග මීටරයක දුරක් පවත්වා ගත යුතු අතර මෙම කාර්ය මණ්ඩලයේ විවේක ස්ථානයක සාමාන්‍යයෙන් වැඩිදෙනා ගැවසෙන බැවින් කළමණාකාරිත්වය මේ පිළිබඳව සොයා බැලිය යුතු ය.
- සෑම පිරිසිදු කිරීමේ වාරයකින් පසු සියළුම පිරිසිදු කිරීමේ උපකරණ සහ ඇඳුම් හොඳින් සෝදා විෂබීජහරණය කර වියළන යන්ත්‍රයකින් හෝ තද හිරු එළිය යටතේ මිනිත්තු 30 ක් තබා වියළා ගත යුතු ය.
- පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලයට සේදීමේ සහ ස්නානය කිරීමේ පහසුකම් ලබා දිය යුතු ය.
- සියළුම පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලයට අපද්‍රව්‍ය කළමනාකරණයේ නිවැරදි ක්‍රියා පටිපාටිය පිළිබඳව පුහුණුව ලබා දිය යුතු ය.

## 11. වරාය භාවිතා කරන්නන්

නෞකා නියෝජිත සමාගම් වල කාර්ය මණ්ඩල සමාජිකයින්, ආනයනික භාණ්ඩ නිශ්කාශනය හා අපනයන බහළු භාර දීම සඳහා පැමිණෙන වාජ්පු ලිපිකරුවන්, MCC මෙහෙයුම් සඳහා පැමිණෙන පෞද්ගලික සමාගම් වල කාර්ය මණ්ඩල, බහලු/ නැව් භාණ්ඩ ප්‍රවාහන කරන රියදුරන් සහ සහයකයින්, නෞකාවන් සදහා විවිධ භාණ්ඩ හා සේවා සපයන කාර්යමණ්ඩල සහ අනෙකුත් වරාය භාවිතා කරන්නන් වරායට පිවිසීමේ දී අනුගමනය කළ යුතු පොදු උපදෙස් වලට අමතරව පහත උපදෙස් තරයේ පිළිපැදීමට වග බලා ගත යුතු ය.

- අදාල භාණ්ඩ සහ බහළු නිශ්කාශනය (Imports) සහ භාරදීම (Exports) සඳහා ලබා දී ඇති විද්‍යුත් පහසුකම් උපරිම වශයෙන් භාවිතා කළ යුතුය.
- නැව් භාණ්ඩ භාර දීමේ නියෝගපත් (FCL Delivery Orders) පිටපත් කොට (Scan) විද්‍යුත් තැපැල් මාර්ගය මගින් ගුදම් භාරකරු (Store Keeper) FCL Delivery වෙත යොමු කළ යුතු ය.
- සියලුම ගනුදෙනුකරුවන් මුඛ-නාස් ආවරණයන් සහ අත් ආවරණයන් පැළඳිය යුතු ය.
- ගනුදෙනුකරුවන් සහ කාර්ය මණ්ඩලය මීටරයක අවම දුරක් පවත්වා ගත යුතුය.
- තම රාජකාරී ලබා ගැනිමට අවශ්‍ය ස්ථාන වල පමණක් රැඳී සිටීමට සහ එක් ස්ථානයක කණ්ඩායම් වශයෙන් ඒකරාශී නොවීම ට ද වග බලා ගත යුතු ය.






# නව ජීවන රටාවකට හුරුවෙමු
# කොවිඩ්-19 පරදවමු




කොවිඩ්-19 රෝගයට හේතුවන වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා සබන් යොදා අත් සේදීම පළමු සහ ප්‍රධාන පිළිවෙතයි. එය ඉතාම සාර්ථක බව පර්යේෂණ විසින් තහවුරු කර ඇත. අත්සේදීම නිසි ලෙස කළ යුතුය. ගලා යන ජලය භාවිතා කොට සබන් යොදා තත්පර විස්සක් පමණ දෑත් සෝදා ගැනීම නිවැරදිව කළ යුතු ආකාරය මෙම රූප සටහනෙන් දක්වා තිබේ. සබන් සහ ජලය නොමැති විට, දෙවැනි හොඳම විකල්පය වන්නේ මධ්‍යසාර අඩංගු සනීපාරක්ෂක ද්‍රව්‍යයක් දෑත් විෂබීජහරණය කිරීමට භාවිතා කිරීමයි.

# නිවසේ සිට නිරෝධායනය ක්‍රියාවලිය





**ඔබට කොවිඩ්-19 රෝග ලක්ෂණ ඇත්නම්**

(උණ, කැස්ස, උගුරේ වේදනාව හෝ හුස්ම ගැනීමේ අපහසුතාවයක් වැනි)

**රෝහලට යාමට පෙර වෛද්‍ය උපදෙස් සඳහා**

**011 7 966 366 අමතන්න**

---

**පැය 24 පුරා විවෘත සෞඛ්‍ය අමාත්‍යංශයේ**

**ක්ෂණික ඇමතුම් අංකය**

**011 3 071 073**

---

**රජයේ මාධ්‍ය ඒකකයේ ක්ෂණික ඇමතුම් අංකය**

**117**

---

**සුවසැරිය ගිලන් රථ සේවයේ දුරකථන අංකය**

**1990/ 071 0 107 107**

---

**සෞඛ්‍ය අමාත්‍යංශයේ වසංගත රෝග ඒකකයේ වෙබ් අඩවිය**

**www.epid.gov.lk**

CPAC

Covid-19 Preventive Action Committee

We are working together to help keep you and your community safe from the threat of Covid-19. Help us to take every recommended health measures to avoid the spread of all respiratory viruses and keep our ports neat and clean.

# කොවිඩ්-19 රෝගයෙන් තොර සුරක්ෂිත වරායක් සඳහා අපි සියලුම දෙනා

## එකතුවෙමු
## සෞඛ්‍ය උපදෙස් පිළිපදිමු
## ආරක්ෂා වෙමු
## ජය ගනිමු

Communication & Public Relations Division
Sri Lanka Ports Authority


**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**
අංක 19, චෛත්‍ය පාර,
කොළඹ 01.
දුරකථන : 94 11 242 12 31 / 94 11 242 12 01
වෙබ් අඩවි: www.slpa.lk සහ news.slpa.lk